පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE


ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂය : - පුරවැසි අධ්‍යාපනය - I, II

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03

01. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල පාලන කටයුතු වලදී ඡන්දදායකයාගේ අදහස් සෘජුවම විමසුමට ලක් කරන එක් ක්‍රමයක් වන්නේ
    (1) පළාත් පාලන මැතිවරණයයි. (2) ජනාධිපතිවරණයයි .
    (3) ජනමත විචාරණයයි. (4) පාර්ලිමේන්තු මැතිවරණයයි.

02. ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතුවක් වන්නේ මින් කුමක් ද ?
    (1) ධනවාදි ආර්ථිකය බිඳ වැටීම. (2) නොදියුණු ආර්ථික තත්ත්වය
    (3) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ (4) යටත් විජිතවාදය

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යයන් උත්සාහ ගන්නේ
    (1) සන්නිවේදන සේවා සම්බන්ධීකරණය කිරීමයි.
    (2) ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම තහවුරු කිරීමයි.
    (3) ගෝලීයකරණ අරමුණු තහවුරු කිරීමයි.
    (4) සංස්කෘතික විවිධතා තුළ ජාතිය ගොඩ නැගීමයි.

04. වර්තමානයේ සමාජ සාධාරණත්වය ගොඩ නැගීම බිඳ වැටීමට බලපෑ හේතුවක් වන්නේ
    (1) නිලධාරීවාදය (2) රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම.
    (3) රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාවය (4) අල්ලස හා දූෂණය අඩුවීම.

05. ජනතාවගේ දුක්ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම,
    (1) බලපෑම් කණ්ඩායම් මගින් ඉටුකළ යුතු කාර්යභාරයකි.
    (2) සිවිල් සමාජය මගින් ඉටුකළ යුතු කාර්යභාරයකි.
    (3) දේශපාලන පක්ෂ විසින් ඉටුකළ යුතු කාර්යභාරයකි.
    (4) නිදහස් මාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්යභාරයකි.

06. දේශපාලන සංවිධායක් ලෙස ජාතික රාජ්‍යයන් යුරෝපය තුළ ආරම්භ වූයේ,
    (1) 14 වන සියවසෙන් පසුව ය. (2) 13 වන සියවසෙන් පසුව ය.
    (3) 15 වන සියවසෙන් පසුව ය. (4) 12 වන සියවසෙන් පසුව ය.

07. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශිය පාලන ඒකක වෙත පවරා දීම,
    (1) බලය බෙදාහැරීම ලෙස හඳුන්වයි. (2) බලය විමධ්‍යගත කිරීම ලෙස හඳුන්වයි.
    (3) බලතල බෙදා දැක්වීම ලෙස හඳුන්වයි. (4) බලය මධ්‍යගත කිරීම ලෙස හඳුන්වයි.

08. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
    (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිතවීම.
    (2) දෙවන මණ්ඩලයක් පැවතීම.
    (3) ව්‍යවස්ථා අර්ථ නිරූපණ බලය අධිකරණයට තිබීම.
    (4) සියලු ජන කොටස් පොදු හැඟීමෙන් කටුයතු කිරීම.

09. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ,
    (1) මිනිස් නිදහස ගිලිහේ.
    (2) ජනවර්ග අතර ගැටුම් වැඩිවේ.
    (3) ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
    (4) අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට ගරු නොවන ආකාරයට හැසිරීමට හුරුවේ.

10. පවුල් ඒකකය මෙන්ම පුද්ගල ජීවිතය යහපත් අයුරින් ගොඩ නැගීමට දායක වන ඉතා වැදගත් ආයතනයකි.
(1) සමාජය (2) පවුල (3) විශ්ව විද්‍යාලය (4) පාසල

11. ගැටුම් නිරාකරණයේදී පුද්ගලයා සතුවිය යුතු සමාජීය ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) කරුණාව (2) ඉවසීම (3) සවන්දීම (4) ඵලදායි සන්නිවේදනය

12. සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් අඩංගු පිළිතුර වන්නේ
(1) වියදම් අධික ක්‍රමයක් වීම. (2) විධිමත් ව්‍යුහයකින් යුක්ත වීම.
(3) විසඳුම් පමා වී ලැබීම. (4) පෞද්ගලික හෝ විස්වාසනීය මට්ටමකින් සිදුවීම.

13. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂාවන් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ
(1) විධායකයයි. (2) ව්‍යවස්ථාදායකයයි. (3) ආණ්ඩුවයි. (4) අධිකරණයයි.

14. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකයට හිමි වන බලතල ක්‍රියාවට නංවන්නේ ,
(1) ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි. (2) අගමැතියයි.
(3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි (4) ජනාධිපතිය.

15. වර්තමාන ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය සඳහා බලපා ඇති වැදගත් හේතුව කුමක් ද?
(1) රටවල භූගෝලීය පිහිටීම. (2) වෙළඳ සබඳතා පුළුල් වීම.
(3) බටහිර රටවලට යටත් වීම (4) විශ්ව ගම්මානයක් බවට පත් වීම.

16. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලින් නිවැරදිව අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?
(1) නිෂ්පාදනය, වෙළඳාම, පරිභෝජනය.
(2) නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිකිරීම.
(3) වෙළඳාම, බෙදාහැරීම, පරිභෝජනය.
(4) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය.

17. පුද්ගලයාගේ සියලුම අවශ්‍යතා හා වුවමනාවන් ඉටු කිරීමට නොහැකි නිසා මුලින්ම තීරණය කළ යුත්තේ ,(1) කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
(2) කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
(3) කා හට නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
(4) කුමක් , කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.

- පහත සඳහන් ප්‍රකාශවලට අදාළව 18 සහ 19 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A –විධායක බලතල ජනාධිපති විසින් ක්‍රියාවට නංවයි.

B –ව්‍යවස්ථාදායකය සන්ධිය මහා මණ්ඩලය ලෙස හඳුන්වයි.

C –මහජන අදහස් විමසීමට සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම නිතර යොදා ගනියි.

D –කොංග්‍රස් මණ්ඩලය ද්වි මාණ්ඩලික වේ.

E – සෙනෙට් සභාව සාමාජිකයින් 100 කින් සමන්විත වේ.

F – කැන්ටන් වලට ස්වාධීනව කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වේ.

18. ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහයේ ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1)ABC (2)ADF (3)BCD (4)ADE

19. ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1)ABC (2)BDE (3)BCF (4)DFB

20. අන්තර් ජාතික ගැටුම් ප්‍රධාන කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය.
(1) ආගමික ගැටුම් හා යුධමය ගැටුම් (2) දේශපාලන ගැටුම් හා මතවාදී ගැටුම්
(3) මතවාදී ගැටුම් සහ යුධමය ගැටුම් (4) ආගමික ගැටුම් සහ මතවාදී ගැටුම්

21. රටක් සංවර්ධනය කරා යන ගමනේදී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) ජාතික සංවර්ධනය ලෙසය.
(2) තිරසාර සංවර්ධනය ලෙසය.
(3) සමාජ සංවර්ධනය ලෙසය.
(4) ආර්ථික සංවර්ධනය ලෙසය.

- පහත සඳහන් ප්‍රකාශවලට අදාළව 22 සහ 23 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A –විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම.

B –බුද්ධිගලනය වේගවත් වීම.

C –දේශීය සංස්කෘතියට බලපෑම් එල්ල වීම.

D –විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමට හැකිවීම.

E – දේශිය යැපුම් ආර්ථික රටාව විනාශ වීම.

F –ආර්ථිකය විවිධාංගීකරණය වීම.

22. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ධනාත්මක බලපෑම් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1)ABC (2)ADF (3)BCD (4)ADE

23. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ඍනාත්මක බලපෑම් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1)ABC (2)BCE (3)BEF (4)DFB

24. පහත දක්වෙන්නේ ගැටුම් නිරාකරණයේදී පුද්ගලයෙකු සතු විය යුතු පුද්ගල ගුණාංග සහ සමාජීය ගුණාංගයන් ය. මෙයින් සමාජීය ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
A –නිර්මාණාත්මක චින්තනය.
B –සවන්දීම.
C –යුතුකම් ඉටුකිරීම.
D –අන් අයට ගරු කිරීම.
E –එලදායි සංනිවේදනය
(1)ABC (2)ADC (3)BDE (4)BCD

25. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ,
(1) රටක සාමය හා සුරක්ෂිතතාවය ඇති කිරීමයි.
(2) රටක ජනතාවගේ ජීවිත, අයිතිවාසිකම් හා දේපළ ආරක්ෂා වන අයුරින් මානව හැසිරීම් පාලනය කිරීමයි.
(3) රටක් නීතියට අනුව පාලනය කිරීමයි.
(4) නීතියට ගරු කිරීම හා අවනත වීමයි.

26. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයක් වන්නේ ,
(1) අභියාචනාධිකරණයයි
(2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) අධිකරණ සේවා කොමිසමයි.
(4) පළාත්බද මහාධිකරණයයි.

27. ජනාධිපති ආණ්ඩුක්‍රමයක දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරීපත් වීම.
(2) විධායකය ව්‍යවස්ථාදායකයට ඍජුවම වගකීමට බැඳී නොසිටීම
(3) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීම.
(4) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සබඳතාවක් දැකිය හැකි වීම.

28. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලාංකිකයින්ට දේශපාලනයට මැදිහත්වීමට වැඩි අවස්ථාවක් උදා වූයේ,
(1) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගිනි.
(2) 1920 මැනිං ප්‍රතිසංස්කරණය මගිනි.
(3)1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගිනි.
(4) කෲ මැකලම් ප්‍රතිසංස්කරණය මගිනි.

29. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් ලැබුණු වඩාත් යහපත් යෝජනාවක් වන්නේ
(1) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය
(2) සර්වජන ඡන්ද බලය
(3) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය
(4) අග්‍රාණ්ඩුකාරධූරයක් ස්ථාපිත කිරීම.

30. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විධායක බලය සහිත ජනාධිපති ධූරයක් නිර්මාණය කළ ආණ්ඩු ක්‍රමය කුමක් ද?
(1) 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයයි. (2) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමයයි.
(3) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයයි. (4) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයයි.

31. රටක සියල්ලට ම ඉහළින් නීතිය පැවතීම හඳුන්වනුයේ ,
(1) නීතියේ යුක්තිය ලෙසිනි. (2) නීතියේ සාධාරණත්වය ලෙසිනි.
(3) නීතියේ ආධිපත්‍යය ලෙසිනි. (4) නීතියේ සමානාත්මතාවය ලෙසිනි.

32. පාරිසරික ගැටළු ඇතිවීම සඳහා හේතුවන ප්‍රධානතම සාධකය කුමක් ද?
(1) සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීමයි. (2) මිනිසුන්ගේ දිළිඳුකමයි.
(3) පරිසරය තුළ ස්වාභාවික විපත් ඇති වීමයි. (4) සම්පත් අසීමිත ලෙස විනාශ කිරීමයි.

33. මානව හිමිකම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මානව අයිතිවාසිකම් භුක්තිවිඳිමට ලැබෙන සමාජයක මිනිස් ජීවිත සුරක්ෂිතව පවත්වාගෙන යාම දුෂ්කර වේ.
(2) ජාතිය, ආගම, භාෂාව, සහ දරන දේශපාලන මතය ආදී සලකා පොදුවේ සැමට හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ.
(3) සෑම මානව අයිතිවාසිකමක්ම මූලික අයිතිවාසිකමක් වේ.
(4) මානව අයිතිවාසිකම් විශ්වීමය සංකල්පයක් වන අතර එය සාධාරණත්වය හා සමානාත්මතා මූලධර්මය මත පදනම් වේ.

34. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව ඇමරිකා එක්සත් ජනපදය යුරෝපා රටවල් සමග එකතු වී පිහිටුවා ගත් සංවිධානය වන්නේ,
(1) නේටෝ සංවිධානයයි ( NATO) (2) යුනෙස්කෝ සංවිධානයයි ( UNESCO )
(3) ආසියාන් සංවිධානයයි ASIAN) (4) බිම්ස්ටෙක් සංවිධානයයි ( BIMSTEC )

35. අපට පරිසරයෙන් ලැබෙන ජීව උපකාරක සේවා සේවාවන් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) හිරුඑළිය, ඛනිජ සම්පත්, වාතය (2) හිරුඑළිය, වාතය ,ජලය
(3) දැව, ශාක, සත්ව ආහාර (4) භූමිය, ජලය, වාතය

36. වර්තමාන ලෝකයේ සංවර්ධිත රටවලට මුහුණ පෑමට සිදුනොවන ගැටලුවක් වන්නේ ,
(1) බලශක්ති අර්බුදය (2) අවාසිදායක වෙළඳ ශේෂය
(3) වෙළඳපොළ තරගය (4) ජාත්‍යන්තර ත්‍රස්තවාදය

37. රටක රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනැගීම සඳහා මගපෙන්වනු ලබන්නේ,
(1) එරට තානාපති සේවයයි. (2) එරට යුධ උපාය ප්‍රතිපත්තියයි.
(3) එරට අන්තර්ජාතික වෙළඳාමයි. (4) එරට විදේශ ප්‍රතිපත්තියයි.

38. ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ජාත්‍යන්තර වෙළෙඳාම සහ රාජ්‍ය උපාය සබඳතා
(2) රාජ්‍ය උපාය සබඳතා සහ යුධ උපාය සබඳතා
(3) ජාතික ආරක්ෂාව හා යුධ උපාය සබඳතා
(4) ජාත්‍යන්තර ආරක්ෂාව හා යුධ උපාය සබඳතා

39. පොදු රාජ්‍ය මණ්ඩලයේ වර්තමාන නායකයා වන්නේ කවුද ?
(1) මහා බ්‍රිතාන්‍යයේ විදේශ ඇමතිතුමා. (2) මහා බ්‍රිතාන්‍යයේ අගමැතිතුමා
(3) මහා බ්‍රිතාන්‍යයේ රජතුමා (4) මහා බ්‍රිතාන්‍යයේ කොමසාරිස්තුමා

40. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එය එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන ආයතනය වේ.
(2) එය එක්සත් ජාතීන්ගේ ප්‍රධානතම අධිකරණ ආයතනය වේ.
(3) ස්ථාවර සාමාජිකයන් පස්දෙනෙකුගෙන් හා ස්ථාවර නොවන සාමාජිකයන් 10 කින් සමන්විත වේ.
(4) එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අයවැය ලේඛනය සකසයි.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂය : - පුරවැසි අධ්‍යාපනය - II

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය :

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) i. රාජ්‍යයේ භූමිකාවට අනුව රාජ්‍යයට පැවරෙන කාර්යයන් 2 ක් ලියන්න.

ii. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ 2 ක් දක්වන්න.

iii. වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ 2 ක් ලියන්න.

iv. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුගේ මානව අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.

v. මෙරට පළාත් සභා වලට බලය බෙදා හැර ඇත්තේ ලැයිස්තු තුනකිනි. ඉන් ලැයිස්තු දෙකක්නම් කරන්න.

vi. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව කොටස් තුනකට බෙදේ. ඉන් දෙකක් නම් කරන්න.

vii. අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි දෙකක් නම් කරන්න.

viii. සම්පත්වල ඵලදායිතාව දියුණු කිරීම සඳහා ලෝකයේ දැනට භාවිතා කරන උපායමාර්ග දෙකක් නම් කරන්න.

ix. ශ්‍රී ලංකාවට විදේශාධාර ලබා දෙන අන්තර් ජාතික සංවිධාන දෙකක් නම් කරන්න.

x. ප්‍රබල රාජ්‍යයන් විසින් බලයෙන් අඩු රාජ්‍යයන් වෙත බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර 2 ක් ලියන්න.

(02) i. පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටළු දෙකක් ලියන්න. (ල. 02)

ii. පුරවැසියන් කෙරෙහි රජයේ වගකීම් තුනක් දක්වන්න. (ල. 03)

iii. (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 03 ක් නම් කරන්න. (ල. 03)

(b) ඉහත (a) හි සඳහන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(03) '' ආණ්ඩුවේ විවිධ ස්ථරයන් වන මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූලික වගකීම වන්නේ නීතිය හා සාමය පවත්වාගෙන යමින් ජනතා අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කර දීමයි.''

i. පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා ඉටු කරන කාර්යයන් 2 ක් ලියන්න. (ල. 02)

ii. A පළාත් සභාවක නාමික විධායකය ලෙස කටයුතු කරන්නේ කවුද ?

B මහ නගර සභාවක ප්‍රධානියා නම් කරන්න.

C ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා නම් කරන්න. (ල. 03)

iii. (a) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා 3 ක් යටතේ ගොනු කර ඇත. එම ප්‍රධාන තේමා 3 නම් කරන්න. (ල. 03 )

(b) ඉහත (a) හි සඳහන් එක් පළාත් පාලන ආයතනයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(04) ''ගැටුම් ඇතිවීමට තිබෙන අවස්ථා අවම කරගැනීම ගැටුම් වළක්වා ගැනීමට හේතු වේ. ''

i. සූක්ෂ්ම ගැටුම්වලට නිදසුන් දෙකක් දෙන්න. (ලකුණු 02)

ii. බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. (a) විනිසීමේ ක්‍රියාවලියේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(b) ඉහත (a) හි සඳහන් විනිසීම පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(05) '' අයිතිවාසිකම් යන්න ඉතා පුළුල් සංකල්පයකි ''

i. මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි කොටස් දෙක ලියන්න. (ල. 02)

ii. ළමා අයිතිවාසිකම් සම්මුතියේ දැක්වෙන මූලධර්ම 3 ක් ලියන්න. (ල. 03)

iii. (a) වැඩිහිටියන්ගේ ( ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ) අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 3 ක් නම් කරන්න. (ල. 03)
(b) ඉහත (a) හි සඳහන් එක් ලක්‍ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(06) '' රටක් අත්පත් කරගෙන ඇති ප්‍රගතිය හා මට්ටම බැලීම සඳහා එම රටෙහි විවිධ පැතිකඩයන් මැනීමට ලක් කළ යුතුය. ''

i. සංවර්ධනය මැනීමේ පරමාර්ථ 2 ක් ලියන්න. (ල. 02)

ii. සංවර්ධනය මැනීම සඳහා යොදාගන්නා නූතන මිනුම් 3 ක් ලියන්න. (ල. 03)

iii. (a) තිරසාර සංවර්ධනය සඳහා පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු පුරවැසි යුතුකම් තුනක් දක්වන්න. (ල. 03)
(b) ඉහත (a) හි සඳහන් එක් යුතුකමක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(07) i. ජාත්‍යන්තර සබඳතා පවත්වන මාධ්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

ii. ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට බලපා ඇති හේතු තුනක් ලියන්න. (ල. 03)

iii. (a) ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල තුනක් ලියන්න. (ල. 03)
(b) ඉහත (a) හි සඳහන් එක් ප්‍රතිඵලයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

**පුරවැසි අධ්‍යාපනය - 11 ශ්‍රේණිය**

**( පිළිතුරු ) - තෙවන වාර පරීක්ෂණය**

## I - කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 4 | 21 | 2 | 31 | 3 |
| 02 | 3 | 12 | 4 | 22 | 2 | 32 | 1 |
| 03 | 2 | 13 | 3 | 23 | 2 | 33 | 4 |
| 04 | 1 | 14 | 3 | 24 | 4 | 34 | 1 |
| 05 | 3 | 15 | 1 | 25 | 2 | 35 | 2 |
| 06 | 3 | 16 | 4 | 26 | 2 | 36 | 2 |
| 07 | 2 | 17 | 4 | 27 | 2 | 37 | 4 |
| 08 | 4 | 18 | 4 | 28 | 3 | 38 | 2 |
| 09 | 3 | 19 | 3 | 29 | 2 | 39 | 3 |
| 10 | 1 | 20 | 3 | 30 | 4 | 40 | 3 |

**පුරවැසි අධ්‍යාපනය - 11 ( පිළිතුරු ) තෙවන වාර පරීක්ෂණය**

01.

1. නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
සමාජ සුභසාධන සේවා සැපයීම.
පොදු සේවා පවත්වාගෙන යාම.
සංවර්ධනය සැලසුම් පවත්වාගෙන යාම .......යනාදිය ( පිටුව 19)

11. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම.
ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවයක් පැවතීම.
විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීම.
විධායකය සිය කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහික ව වගකීමට බැඳී සිටීම.
දේශපාලන විධායකය , නාමික විධායකය හා සත්‍ය විධායකය යන අංග දෙකකින් යුක්ත වීම.

111. රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම.
වෙළඳපොල තත්වය මත මිල තීරණය වීම.
ආයෝජකයන් දිරිගැන්වීම.
සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම.
පෞද්ගලික දේපල අයිතියට ඉඩදීම. .....යනාදිය ( පිටුව 78)

1v . ශ්‍රේෂ්ඨාධිකරණයට දැන්වීම.
මානව හිමිකම් කොමිසන් සභාවට පැමිණිලි කිරීම.
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත දැන්වීම. (ඔම්බුඩ්ස්මන්) ... (පිටුව 75)

V. පළාත් සභා ලැයිස්තුව.
සංවෘත ලැයිස්තුව.
සමගාමී ලැයිස්තුව

V1. පාරිභෝගික භාණ්ඩ
අන්තර් භාණ්ඩ
ප්‍රාග්ධන භාණ්ඩ

V11. රාජ්‍ය විරෝධී ක්‍රියා
මරණය සිදු කිරීම
මරණය සිදු විය හැකි අන්දමේ ශාරීරික පීඩා ඇති කිරීම.
මරණය සිදු විය හැකි අන්දමේ තුවාල කිරීම.
ලිංගික අපරාධ
ස්ත්‍රී දූෂණය
පොදු දේපලවලට හානි සිදු කිරීම
දේපල හොරකම් කිරීම
කොල්ල කෑම
සොර බඩු ළඟ තබා ගැනීම
මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම
මත්ද්‍රව්‍ය අලෙවිය
ළමා අපචාර
පැහැර ගැනීම
අතුරුදහන් කිරිම

V111.
5 S - ඵලදායිතා සංකල්පය භාවිතය
CP - සුපිරිසිදු නිෂ්පාදනය
GP - හරිත ඵලදායිතාව
TQM - පූර්ණ ගුණාත්මක කළමනාකරණය
Poka Yoke - වැරදි ශුන්‍ය කිරීම
PPP - බැහැර කිරීමේ වගකීම නිෂ්පාදකයාට පැවරීම
3 R - නැවත භාවිතය, ඉවත් කිරීම, ප්‍රතිචක්‍රීකරණය

1x. ලෝක බැංකුව
අන්තර් ජාතික මූල්‍ය අරමුදල
ආසියානු සංවර්ධන බැංකුව
අන්තර් ජාතික සංවර්ධන සංගමය

x. අන්තර් ජාතික වෙළඳාම.
ණය හා ආධාර දීම.
ආර්ථික සංවර්ධනය.
ආරක්ෂක ක්ෂේත්‍රය.
රැකියා සැපයීම.

( එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි. )

02. 1. වර්තමාන රාජ්‍යය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
වර්තමාන රාජ්‍යය අධික ජනගහනයකින් සමන්විත වීම
සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුව
සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම

( ලකුණු 02 )

11. නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම.
පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම.
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම. .....යනාදිය ( පිටුව 25)

( ලකුණු 03 )

111. නිදහස් හා සාධාරණ මැතිවරණ.
නීතියේ ආධිපත්‍ය පැවතීම.
අධිකරණයේ ස්වාධීනත්වය.
දේශපාලන අවබෝධයකින් යුත් ජනතාවක් සිටීම.
යහපත් ආර්ථික මට්ටමක් තිබීම.

නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍ය පැවතීම.

( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02 )

03. 1. පළාත් ආණ්ඩුකාරවරයාට උපදෙස් ලබා දීම.
පළාත් අයවැය ලේඛනය සකස් කිරීම.
පළාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසුම් සකස් කිරීම.
ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

( ලකුණු 02 )

II. A ආණ්ඩුකාරවරයා
B නගරාධිපති / පුරපති
C සභාපති (ල. 03)

111. පොදු මංමාවත්
මහජන සෞඛ්‍ය
පොදු උපයෝගිතා සේවා වශයෙන් ( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02)

04. 1. අපේක්ෂාභංගත්වය නිසා පුද්ගලයා තුළ ඇතිවන මානසික ගැටුම්.
ආර්ථික ප්‍රශ්න නිසා පවුල තුළ ඇතිවන ගැටුම්.
ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නිසා ඇතිවන ගැටුම්.
ඉඩම් ආරවුල් නිසා ඇතිවන ගැටුම්

( ලකුණු 02 )

11. හොඳින් සවන්දීම.
පක්ෂග්‍රාහී නොවීම.
මධ්‍යස්ථ වීම.
නිවැරදී තීරණ ගැනීම.
විචාරශීලී හා නිර්මාණශීලි බව.
සාධාරණභාවය.
යමක් අර්ථවත්ව පැහැදිලි කිරීමේ හැකියාව

( ලකුණු 03 )

111. විත්තිකරු අධිකරණයෙහි පෙනී සිටිය යුතුය.
සාක්ෂි දීම, නඩු ඇසීම විධිමත් ව සිදුවේ.
නීතියේ ප්‍රතිපාදන අනුව තීරණ දීම.
අභියාචනා කිරීමේ හැකියාව ...... යනාදිය ( පිටුව 104)

( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02)

05 1. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
ආර්ථික ,සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්

(ලකුණු 02 )

11. ළමයාගේ උපරිම යහපත
සහභාගීත්වය
පැවැත්ම හා සංවර්ධනය
වෙනස්කොට නොසැලකීම

(ලකුණු 03 )

111. නොයෙකුත් සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අවස්ථා සලසා දීම.
වැඩිහිටියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.

( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02)

06. 1. ආර්ථික ප්‍රතිපත්ති සැකසීමට.
සංවර්ධන විෂමතා හඳුනා ගැනීමට.
රටවල් සමඟ සැසඳීමට.
ගැටළු අවබෝධ කර ගැනීමට.
ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීමට.

( ලකුණු 02 )

11. භෞතික ජීවන තත්ත්ව දර්ශකය.
මානව සංවර්ධන දර්ශකය.
මානව පීඩන දර්ශකය.
දුරකතන ඝනත්වය.
පරිඝණක සාක්ෂරතාවය ........ යනාදිය (පිටුව 106)

( ලකුණු 03 )

111. අධිපරිභෝජනයෙන් වැළකීම
පරිසර නීති වලට අනුගත වීම
නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
බලශක්ති සංරක්ෂණයට යොමු වීම
පරිසර හිතකාමී ජීවන රටාවකට හුරු වීම.
සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.
සරල දිවි පැවැත්මකට හුරු වීම.
භෞතික පරිසරයට හානි නොකිරීම

( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02)

7 1. තානාපති සේවය - පරිත්‍යාග
ජාත්‍යන්තර වෙළඳාම - යුද්ධය
විදේශාධාර - සාමය

(ලකුණු 02 )

11. සම්පත් විසංතුලනය.
අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම.
අතිරික්ත නිෂ්පාදනය අලෙවි කර ගැනීම.
ප්‍රවාහනයේ හා සන්නිවේදනයේ දියුණුව.
දියුණු තාක්ෂණය ලබා ගැනීම.
හදිසි ආපදා සහ විපත් අවස්ථාවලදී සහය ලබා ගැනීමට
දේශපාලන , ආර්ථික , සමාජ, සංස්කෘතික සබඳතා වර්ධනය කර ගැනිම.

(ලකුණු 03 )

111. ජාත්‍යන්තර සුහදතාවය වර්ධනය වීම
නව රැකියා අවස්ථා ඇති වීම.
තාක්ෂණික දැනුම හුවමාරු කර ගත හැකි වීම.
හදිසි අවස්ථාවලදී අන්‍යෝන්‍ය ආධාර උපකාර ලබා ගත හැකි වීම.
සංවර්ධනයට අවශ්‍ය සහාය ලබා ගත හැකි වීම.

( කරුණු තුනට ලකුණු 03 )
( විස්තරයට ලකුණු 02)

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**